# දහම් පාසල් දරුවන් වෙනුවෙන් ශුද්ධ වූ පැයක්

## 1 කොටස

- ❖ **ගීතිකාව - පනතක් මම ඔබට දෙමී...**
- ❖ **මතෙව් 26/36-39**
- ❖ **මෙනෙහි කිරීම**

ජේසුස් වහන්සේ ගෙත්සේමනි උයනට වැඩියේ පියාණන් වහන්සේ තමන් වහන්සේව මෙලොවට එවීමේ අරමුණ සම්පූර්ණ වීමේ මොහොත සමීප බව හොඳින් අවබෝධ කරගෙන ය. ජේසුස් වහන්සේ මිනිසත් බව ගත් දේව පුත්‍රයා ය. මල් උයනේදී උන්වහන්සේගේ මිනිසත් බව ඉස්මතුවන ආකාරයත්, එයට යට නොවී පිය දෙවිඳුන්ගේ කැමැත්තට මුළුමනින්ම අවනත වන ආකාරයත් "මැරෙන තරමට මාගේ සිත අතිශයින් ශෝකාන්විත ය" යන වචනවලින් පැහැදිළි වේ.

තම කැමැත්ත යටපත් කරමින් දේව කැමැත්තට අවනත වීම පහසු කාර්යයක් නොවේ. එහෙත් උන්වහන්සේ මෙම කයුුර දුක් පාත්‍රය වැළඳ ගන්නේ "එහෙත්, මා කැමැති ලෙස නොව, ඔබ කැමැති ලෙස වේ වා" යනුවෙන් පියාණන්ගේ කැමැත්තට මුළුමනින්ම අවනත වෙමිනි. එලෙස අවනත වීමට බැහැපත් වීම අත්‍යාවශ්‍යය.

නිතිපතා අප ස්වර්ගයේ වැඩසිටින යාච්ඤාව උච්චාරණය කරමින්, ස්වර්ගයෙහි දෙව්පිය අභිමතය ඉටුවන්නා සේම, මෙලොවෙහි ද දේව කැමැත්ත ඉටුවේවා යනුවෙන් යදියි. මෙලොවෙහි දී දේව අභිමතය ඉටු වීමට නම් අපගේ ජීවිතයේ විවිධ වූ සිද්ධීන් හරහා එළිදරව් වන දේව කැමැත්තට අප හිස නැමිය යුතුමය. එදා ජේසුස් වහන්සේ ද තම කැමැත්ත අභිබවා යන දේව කැමැත්තට අවනත වීමේ අපහසුතාවය ජයගැනීමට මල් උයනේ මුනින් වැටී දිගින් දිගටම තම පියාණන් වහන්සේට යාච්ඤා කළ සේක.

ජේසුස් වහන්සේ මල් උයනේ අත්දැකීම් මේ මොහොතේ මෙනෙහි කරන දේව දරුවන් වන අප ද, ජේසු තුමා මෙන් දෙව් පියාණන්ගේ කැමැත්තට අවනතව ජීවත් වීමට අදිටන් කර ගනිමු.

**2 කොටස**

**යාච්ඤාව**

**ආදර ජේසුනි,**

එදා මල් උයනේදී ඔබවහන්සේ වින්දාවූ දුක් ගාවිනා වලට මටත් පංගුකාරයෙකු වන්නට තිබුනා නම් කොතරම් හොඳයි ද ජේසුනේ... එත් ජේසුනේ අද දවසේදීත් මට කොතරම් නම් ඔබව මග හැරෙනවාද? මම කොතරම් ඔබව අමතක කරනවාද, ජේසුනේ...

මගේ වරදකාරී බව මම පිළිගන්නවා ජේසුනි... එදා මල් උයනේදී ගෝලයන් නිදා ඉන්නවා දැක ඔබවහන්සේ දුක් වුනා වාගේ අදත් මගේ ඇල්මැරුණු ජීවිතය ගැන ඔබවහන්සේ දුක්වෙනවා ඇති ජේසුනේ…

මට සමාවෙන්න ජේසුනේ... ඔබවහන්සේ මට දිනකට පැය 24 ක් දුන්නා. එත් ඉන් පැය භාගයක්වත් ඔබවහන්සේට දීමට මට නොහැකි වුනා. රූපවාහිණිය ඉදිරියේ, අන්තර්ජාලයේ, මුහුණු පොතේ පැටලිලා මම පැය ගණන් ගතකලා ජේසුනේ. ඒත්.... ඒත් …. මට යාච්ඤා කරන්නට , ජපමාලය උච්චාරණය කරන්නට, ඔබවහන්සේ වෙනුවෙන් මගේ කාලය වෙන් කරන්නට බැරි වුනා. මට ඔබවහන්සේ සමඟ කතා කරන්න, ඔබවහන්සේගේ හඬට සවන් දෙන්න බැරි වුනා ජේසුනේ...

ඔව් ජේසුනි, මම පොරොන්දු වෙනවා අද ඉදන් මම වෙනස් වෙනවා කියලා. මේ මොහොතේ පටන් මම අලුත් පුද්ගලයෙකු වෙනවා කියලා. මගෙන් මගහැරුණු ඒ ජීවිතය මං සොයා ගන්නවා ජේසුනේ...

මං වෙනුවෙන් දුක් විඳලා, මගේ පව් වෙනුවෙන් ජීවිතය පූජා කරලා අදත් මං වෙනුවෙන් සත්ප්‍රසාදයේ වැඩසිටින ඔබවහන්සේව තනි කරන්නේ නෑ කියල මං පොරොන්දු වෙනවා ජේසුනේ...

ඔබවහන්සේගේ හඬට සවන් දෙන්න ඔබවහන්සේ එක්ක කතා කරන්න මං මගේ කාලය දෙනවා ජේසුනේ... ඔව් ජේසුනේ ඔබවහන්සේගෙන් දුරස් වුන මගේ ජීවිතය මං ඔබවහන්සේ ළඟට ආයෙත් අරන් එනවා ජේසුනේ...

මාව පිළිගන්න ඔබවහන්සේ ආසාවෙන් දෑත් දිගුකරන් බලා ඉන්න බව මම දන්නවා ජේසුනේ... අද දවසේ දී මගේ අතින් මග හැරුණු මාගේ ජීවිතය ඔබට බාරයි ජේසුනේ...

ආමෙන්....!!!

- ❖ **ගීතිකාව - මා පියුමක් ලෙස . . .**

**3 කොටස**

අපි මොහොතක් උන්වහන්සේගේ වේදනාවෙන් පීඩිතවූ , ශෝකයෙන් බරවූ හදවතට සංවේදී වෙමු. අප ගෙවා දැමූ වතාරිකයේ දිනවලට , අප ගත කරන මේ මොහොතට සහ අප ඉදිරියේ සහභාගී වන්නට සූදානම් වන උන්වහන්සේගේ දුක්ප්‍රාප්ති මෙහෙයට අප තුල ඇති සංවේදීතාවය සිහිපත් කරමු. ඇත්තෙන්ම මෙය අප තුල සැබෑ ජීවිත පරිවර්තනයක් ඇති කළ , වරප්‍රසාදයේ කාල සීමාවක් ද? නැතිනම් හුදෙක් ගතානුගතිකව භක්ති අභ්‍යාස , දයාවේ ක්‍රියා සහ ජනවන්දනාව සිදු කල කාල සීමාවක් ද? ඔබට මට සැබවින්ම උන්වහන්සේගේ වේදනාව අත්දකින්නට හැකි වුනාද? උන්වහන්සේගේ ප්‍රේමය අප ජීවමාන ලෙස අත්දුටුවාද? උන්වහන්සේගේ ප්‍රේමය සාක්ෂි දරන්නට , මගේ සහෝදරයාගේ වේදනාව තුල උන්වහන්සේගේ වේදනාව හඳුනාගන්නට අපට හැකි වුනාද? පවුල තුල, පාසල තුල, රැකියා ස්ථානය තුල, ගම තුල මම ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයට විශේෂාකාරයෙන් සාක්ෂි දරමින් උන්වහන්සේගේ ප්‍රේමය තුල ජීවත් වූවාද?

අපි මොහොතක් දෙනෙත් වසාගෙන, දෑත වැදගෙන, ජීවමාන ක්‍රිස්තුන්වහන්සේව අප තුලට කැඳවා ගනිමු. උන්වහන්සේව අත්දකිමු. මේ මොහොතේ උන්වහන්සේ අප අසලින්ම සිටින බව විශ්වාස කරමු. අපගේ ජීවිතය පුරාවට නොවෙනස්ව පවතින, අප පසුපස හඹා එන උන්වහන්සේගේ අසීමිතවූ ආදරය අත්දකිමු . උන්වහන්සේ මේ මොහොතේ අත්දකින ඒ දරාගත නොහැකි ශෝකයේ වේදනාවට, හුදෙකලා භාවයට අතුලුවෙමු. උන්වහන්සේව තනි නොකර, උන්වහන්සේගේ කුරුසිය යාගය පුරාවටම උන්වහන්සේ සමගින් ඒ වේදනාව ප්‍රේමයෙන් යුතුව දරාගන්නට, උන්වහන්සේගේ හදවතට සහනයක් වන්නට මුළු හදවතින්ම උන්වහන්සේට පොරොන්දු වෙමු.

- ❖ **ගීතිකාව - සිතුවිල්ලක් විලසින් ....**

**4 කොටස**

බැහැපත්කමේ ශක්තිය පතා නිතරම දෙවි පියාණන් යදිමු. ඒ තුළ ජීවිත අභියෝගයන්ට මුහුණ දීමට අවශ්‍ය දිරිය ලබමු.

**විශ්වාසිකයින්ගේ යැදුම්**

**ඔබගේ පිළිතුර: ස්වාමිනි අප කරන යාච්ඤා අසා වදාළ මැනව**

1. ආදර ජේසුනි, දුබල මිනිස් බව වැළඳගත් ඔබවහන්සේ, දේව කැමැත්තට අවනත වෙමින් අපට දුන් ආදර්ශය අනුව යමින් සිසු දරුවන් ලෙස දේව කැමැත්තට අවනතව ජීවත් වීමට අවශ්‍ය ශක්තිය ලබා දෙන පිණිස ද,

**ඔබගේ පිළිතුර: ස්වාමිනි අප කරන යාච්ඤා අසා වදාළ මැනව**

2. දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ සිටින ජීවමාන ජේසුනි, දේව කැමැත්ත අනුව ජීවිත හැඩගස්වා ගැනීමට අපට මඟ පෙන්වන දෙමාපියන්, ගුරුමව්පියන්, පූජක පැවිදි සැමදෙනාගේ අවවාදයන්ට සවන් දෙමින් අපට පැවරී ඇති කාර්යය නොපිරිහෙලා ඉටු කිරීමට අවැසි බලය ලබා දෙන පිණිස ද,

**ඔබගේ පිළිතුර: ස්වාමිනි අප කරන යාච්ඤා අසා වදාළ මැනව**

3. ජීවමාන ජේසුනි, ශාරීරිකව, මානසිකව සහ අධ්‍යාත්මිකව රෝගීව සිටින අප මීසම් වාසී සැමට මෙම පාස්කුව තුළ ඔබවහන්සේව ජීවමානව අත්දැක, නිරෝගී බවේ ප්‍රීතිය අත්විඳීමට අවස්ථාව උදාකර දෙන පිණිස ද,

**ඔබගේ පිළිතුර: ස්වාමිනි අප කරන යාච්ඤා අසා වදාළ මැනව**

4. උත්තම ගුරුදේවයාණන් වූ ජේසුනි, ඔබවහන්සේව ආදර්ශයට ගනිමින්, ක්‍රිස්තු වටිනාකම් අනුව සිසු දරුවන්ගේ ජීවිත ගොඩනැංවීමට අවශ්‍ය ශාරීරික, මානසික සහ අධ්‍යාත්මික සුවය දහම් ගුරු මව්පියවරුන්ට ලබා දෙන පිණිස ද,

.

**ඔබගේ පිළිතුර: ස්වාමිනි අප කරන යාච්ඤා අසා වදාළ මැනව**

**5 කොටස**

- ❖ **1 ජොහාන් 5 : 1 – 5**
- ❖ **මෙනෙහි කිරීම**

මේ මොහොතේ ක්‍රිස්තුන් වහන්සේ තුල අපි එම විමුක්තිය අත් දකින්නට උත්සහා කරමු. පාපයෙන් අදුරුවූ , ශෝකයෙන් වැසුණු අපගේ ජීවිත අපගේ විමුක්ති දායකයාණන් වූ ස්වාමීන් වහන්සේට කැප කරමු . උන්වහන්සේ මේ මොහොතේ අපට දානය කරන නිදහස අත්දකිමු . දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුලින් මේ මොහොතේ අප වෙත ගලා එන අසීමිතවූ ප්‍රේමය අපගේ හදවත් විවර කරමු. උන්වහන්සේගේ කොන්දේසි විරහිතවූත් සදාකාලික වූත් ඒ උතුම් ප්‍රේමයෙන් අප ජීවිත පුරවා ගනිමු .

- ❖ **ගීතිකාව - පෙම් කරන්න එකිනෙකාට . . .**

**6 කොටස**

සිය ප්‍රේමය තුල පවතින්නට අපට ආරාධනා කරන සමිඳුන්ට අපි අපගේ ප්‍රේමය මෙලෙස ප්‍රකාශ කරමු.

ඔබගේ පිළිතුර - මම ඔබවහන්සේට ප්‍රේම කරමි.

1) **අපට ඉමහත් ලෙස ප්‍රේම කලාවුද , අනන්ත දයා කරුණා සාගරය වූද , අපගේ එකම ජීවිත අරමුණ වූ ද ජේසුනි ,**

ඔබගේ පිළිතුර - මම ඔබවහන්සේට ප්‍රේම කරමි.

2) **පියකය මත්තෙහි අප උදෙසා දිනපතා බිලි පඬුරක් ලෙස ඔප්පුවන්නාවූ ජේසුනි ,**

ඔබගේ පිළිතුර - මම ඔබවහන්සේට ප්‍රේම කරමි.

3) **ඔබගේ නිර්මල ශරීරය මාගේ ආහාරය කොට , දිව්‍ය සත්ප්‍රසාදය මගින් දානය කරන්නාවූ ජේසුනි ,**

ඔබගේ පිළිතුර - මම ඔබවහන්සේට ප්‍රේම කරමි.

4) **සියල්ලන් මා අත්හැර යන මොහොතේ පවා අසරණ මා තුලට වඩින්නට තරම් මට ප්‍රේම කලාවූ ජේසුනි ,**

ඔබගේ පිළිතුර - මම ඔබවහන්සේට ප්‍රේම කරමි.

5) **දේවත්වය පසෙකලා, මගේ ගැලවීම පිණිසම මනුකය ගත් මගේ දයාබර ජේසුනි ,**

ඔබගේ පිළිතුර - මම ඔබවහන්සේට ප්‍රේම කරමි.

**7 කොටස**

- **ජොහාන් 14 : 15 – 2**
- **මෙනෙහි කිරීම :**

එසේනම් අප මේ සූදානම් වන්නේ ගැළවීමේ දිනයටයි . උත්ථානයේ විජයග්‍රහනයටයි . ඒ සඳහා අප ක්‍රිස්තුන්වහන්සේ සමග සම්බන්ද වෙමු. අපගේ ජීවිත මේ මොහොතේ උන්වහන්සේට භාර කරමු. දේව දරුවන් වශයෙන් දෙවිපියානන්ගේ කැමැත්ත අපගේ ජීවිත තුලින් ඉටු කරන්නට සිතට ගනිමු. දරුවන් වශයෙන් අපගේ දෙමාපියන් , ගුරුවරුන් , වැඩිහිටියන් තුලින් දෙවිපියානන්ගේ කැමැත්ත අවබෝධ කරගන්නටත් වැඩිහිටියන් වශයෙන් අපගේ ජීවිත තුල දේව කැමැත්ත වටහා ගනිමින් එය ඉටු කරන්නටත් , සමාජය තුල ආදර්ශවත් දිවි පෙවතක් ගත කරන්නටත් අප මේ මොහොතේ දිව්‍ය සත්ප්‍රසදිය සමිඳුන් ඉදිරියේ පොරොන්දු වෙමු .

නව ජීවිත වෙනසක් තුල සැබෑ ක්‍රිස්තියානි ජීවිතයකට සාක්ෂි දරමු . පැරණි ජීවිතයෙන් නව ජීවනයක් ලබා ක්‍රිස්තුන්වහන්සේ තුල උත්ථාන වෙමු.

- **ගීතිකාව - යනවා ආයෙත් මා එනවා . . .**